# පහන් වැට

සංස්කරණය
මෛත්‍රී ප්‍රසාද්
ජයවර්ධන

## පහන් වැට දල්වන්නට.....

සත් සමුදුරින් පැන විත් මව් බිම    හැරදා
සිය නෑ මිතුරු කැළ යළි දකිනුද    කවදා
සොයනා විට සැපය අපමණ දුක    පරදා
සිහල සිතට කවි කියවෙනවා    හැමදා

පොරවා ඇඳුම් තුන හතරක්    හීතලට
ලුණු මිරිසට නැතත් කුස පුරවා    යසට
කේතුමතී නුවරක් කීවත්    මෙරට
සිත යට දැනෙන තනියට කවියකි    පිහිට

සන්නස සමඟ ගනු දෙනු කරන ඔබ    ළඟ
කවියක් නොවුණු සිතුවිලි ඇති සැඟව    මඟ
කවියට සිතැති නුඹ වෙත ඇරයුමක්    වග
දැන එනු මැනවි සරසන්නට පහන්    වැට

**මෛත්‍රී ප්‍රසාද් ජයවර්ධන**

## රහස

මුලු ලොවම විඩාවෙන්
නිදන සඳ යහන් ගැබ
හද රැ දුන රහස - ඔබ
පුබුදුවයි නොනිදි සිත.

මී විතින් දොඬමලුව
ගයන මිතු කැලත මැද
සිතින් තනිවෙන සඳෙහි
රහස - ඔබ තනි රකියි.

අඳුරු හද පතුල තුල
පතුරුවන පහන් රැ ස
රහස - නුඹ හද ගැබෙහි
සහන් සිතුවිලි නගයි.

මගේ හද හැර නොගොස්
සාංකා නැසු - රහස,
මා මියැද යන දිනෙක
හිස් අහස හා එක්ව
රහස් බව රකිනු මැන..

**විජයසිරි තිලකුමාර**
බ්‍රිස්බේන්

## ඔබටයි මේ........

දෙසවන් තුල හඬ රැ වී දෙන්නේ    ඔබ
නෙත් කෙමි තුල රුව    සැරිසරනා    ඔබ
සිත් කුටියේ පියවර මහිනා    ඔබ
තෙලි තුඩ සොයනා තේමාවත්    ඔබ

දිවියට අරුතක් ගෙන දුන්නේ    ඔබ
හිතා ගන්නවත් බැරි ලෙසටයි    ඔබ
නොනිමී සෙනෙහස පිදුවේ මට    ඔබ
මා සිත නිරතුරුවම සොයනුයෙ    ඔබ

තනි මග යන මට අත් වැල උන    ඔබ
හුරු නැති මගකයි යන්නේ මා    ඔබ
දිනක් ඒවි මා හැර යන    ඔබ
සදහට ආදරයෙන් ඉමු    මා    ඔබ

සිහියට ආවත් අන් සතු බව    ඔබ
අමතක කරනුයෙ කෙලෙසද    මා    ඔබ
මට පමණක් වම ලබනට බැරි    ඔබ
එනමුදු මනසින් මට පමණයි    ඔබ

**යසා හැනන්බර්ග්**

## තොරොම්බල්

මාල වලලු
නෙක විසිතුරු මුදු කරාබු
නියොන් ලයිට් යට දිලිසෙන
තොල් සායම් ආලේපන
එන කාටත් දත නියවන,
සාප්පුවක
මම මොහොතක් නතර වුනෙමි.
පැක්ටරියේ
මර හඬ දෙන කියත් අතර
මගේ වෙහෙස සංසිඳුවන
ඔබේ සිනා වත සිහි විනි.
අතේ පැලුනු
කරගැට දී ලබා ගත්ත
ඩොලර් වලට
වීදුරු කැට මාරු කලෙමි.
කතා බහට වචන නැතුව
හොරෙන් වගේ අතේ තබන
මේ වීදුරු මාල වලට
මගේ හිතේ,
හැංගී ගෙන මුව ගොලු වන
සෙනෙහස ගැන කියා ගන්න
කවදාවත්
වචන ඇති වෙදැයි නොදනිමි

**තුසිත් අබේනායක**

## තුන්වැන්නාගේ ප්‍රකාශය

*මට අහිමි වූ සුව*
*විඳිනා ඔබ ගැන*
*අහිතක් නැත මා සිත තුල කිසි කල*

*තනිවුණු අසරණ*
*මා ගැන ඇතිවුණු*
*ආත්මානුකම්පාවක් මිස*

***ර. චන්ද්‍රසූරිය***



## විශ්සානය ඇරඹින

මලිත්තෙක් ආවේ ය මිදුලට
තණ පත් අතර කැරකෙමින්
පෑවේ ය රැඟුමක්
මුලු මහත් කරලියම ඇගේ
මෙන්

අහස් කුස ගති - වලාකුළු
ලකුණු කෙරුවේය සදිසා
තණ බිම් මත වැටුනු
සෙවනැලි

මදනල පෙරටු වී
රැගෙන ආයේය පුවතක්
රෝස කැකුළක් නැගින
සිරුවෙන්
පිලිගනු ලෙසින් අමුත්තා

පිනිබිඳක් වැටින
නළල් පට මත
මුදු සුමුදු ඇඟිලි තුඩු මත
සුළං දැල්ලක් නැගී
මලිත්තා ඉගිලින -
ආගන්තුකයාට ඉඩ දී

**චන්ද්‍රිකා ද සිල්වා**
පර්ත්

## විශෝගය

*සේද වලා සළු අතරින්*
*එබී බලා චන්ද්‍ර මඬල*
*ඔච්චම් ලෙස සිනා වෙලා*
*අඳුරු පටලයෙන් වැසුනා*

*වලා පෙලින් පෙරී අවුත්*
*හොරෙන් පතිත චන්ද්‍ර බිම්බ*
*සූර්ය තාපයේ තරමට*
*උනුසුම් ඇයිදෝ සිතූනා*

*කුමුදු කුසුම් දෑ සමන්*
*නිසල රැ යේ පිපුණු නමුදු*
*ලොවට හොරෙන් මට ඉඟි කර*
*අරුණට පෙර මිලින වුනා*

*වනමල් සුවඳේ මුසුවී*
*ලන්ද දෙසින් සෙමින් හැමූ*
*මුදු පවනැලි සැඬ සුළඟක්*
*ලෙසින් හමා ඇදුනා*

*හිමිදිරියේ සුපිපි කුසුම්*
*පෙති මිලිනව වැටුනා*
*අරුණෝදයෙ විහඟ ගීත*
*නඳ ගොළු වී තිබුණා*

*වෙල ලන්දේ ඉස්මත්තෙන්*
*සිසිළ දිදී සෙමින් ගැලූ*
*දොල පහරේ ගී තාලය*
*දිය සුළියක ගිලුනා*

*මගෙන් මිදුනු ඔබ ඔහුගේ*
*මුදු සුව පහසේ නැලැවෙන*
*පුවත අසා පුර පස සඳ*
*මධු බඳුනක ගිලුනා*

***ආර්. එම්. ඩයස් රණතුංග,***
*ඩුබායි, යු. ඒ. ඊ.*

## අනුබුදු හිමියනි

*අඹතල මුදුනේ මිස්සක පව්වේ*
*බැබලී හිනැහුණු පොසොන් සඳේ*
*රැ ස් නව දැලි හේනේ සිටි වැදිරීය සේ*
*මැකී ගියා ඔබ පෑයූ මොහොතේ*
*අනුබුදු හිමි සඳුනේ*
*අඳුරු තිමිර බිඳලූ*

*සම්මා සම්බුදු ගිය මග යමිනේ*
*නිවන් පුරට මං සළකුණු කීවේ*
*අදත් ඇසෙයි ඒ සුමධුර රාවේ*
*සිරිලක සතර දෙසේ*
*අනුබුදු හිමි සඳුනේ*
*දහම් පහන දැල්වූ*

*දුනු හී අතහැර බොදුනු මගට වන්*
*දේවානම් පියතිස් නරනිඳු සේ*
*පවිටු දුදන සිත නිවැරදි කල මැන*
*දෙසු දම් අනුහසිනේ*
*අනුබුදු හිමි සඳුනේ*
*සසර ගමන සිඳලූ*

***ශ්‍රියා කුමාරසිංහ***
*නවසීලන්තය*

## සත්තයි..! එන දුරුත්තේ මං ආපහු එනවා

*ලංකාවේ සිටින බිරිඳට*

ගීතාල්, මිහිරි හා පොඩි දුව    මනුෂී ද
මගෙ නොදරුවන් කෙතරම් දැන්    වැඩිලා ද
නුගවෙල කුඩම්මා ඇගෙ දුව    තමරා ද
අදරින් මතක් කල බව    පවසනවා ද

කොන්දේ අමාරුව තවමත්    ගුණ නැද්ද
නාහල්ලේ වෙද ගෙදරට    ගියෙ නැද්ද
මං දෙන අවවාද කනකට    ගන්නවද
එදා හපපු තැන තවමත්    රිදෙනවද

ක්‍රෙන්පෝ විහාරේ පෝ දා බණ    තිබුනා
කන්දේ විහාරේ මල් සුවඳම    දැනුනා
අම්මා තාත්තා සිහිකර පින්    දුන්නා
ඔබ නැති අඩුව මගෙ සිත තුල රජ කෙරුනා

ඉරිදා දිනෙක මිතුරෙකු හා මා    දන්නා
කෙනත් හාන් උයනට පියවර    මැන්නා
හංස යුවල දැක පොකුණක පෙම්    කෙළිනා
සිහි වී යමක් නෙතගින් කඳුලක්    පැන්නා

දරුවන් මතක් වී උණු කඳුලැලි    බොනවා
හැම හීනෙකම ඔබෙ රූපය දිස්    වෙනවා
ඔබෙ උණුසුම නැතිව සිව් වසරක්    වෙනවා
සත්තයි.! එන දුරුත්තේ මං ආපහු    එනවා

**එන් වීරසිංහ**
ලොස් ඇන්ජලීස්

## සන්නස සාහිත්‍ය තරගාවලිය 2006

සන්නස මෙහයෙවන සාහිත්‍ය තරග මාලාවේ 2006 පියවර සඳහා අපට ලැබුණ නිර්මාණ සංඛ්‍යාව ඉතා විශාලය. මේ දිනවල අපේ විනිශ්චය මණ්ඩලය විසින් මේ සියළු නිර්මාණ අගැයීමට ලක් කෙරෙමින් පවතින බව නිර්මාණ ඉදිරිපත් කළ ඔබට දන්වනු කැමැත්තමු.

මීළඟ සන්නස කළාපයෙන් ප්‍රතිඵල නිකුත් කරන්නට අපි බලාපොරොත්තු වෙමු.